**රාජ්‍ය දැව සංස්ථාව - 2021**
-----------------------------

## I. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

රාජ්‍ය දැව සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---------------------------------------------------------------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

-------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත්, වර්ෂයේ සත්‍ය මුදල් ගලා යාම සහ සත්‍ය මුදල් ගලා ඒම නොසලකා, ප්‍රමිතයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. | | |
| I. දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලද රු.1,237,220 ක මුදල් ගලා ඒම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගලපා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද බදු රහිත මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒමක් ලෙසත්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙසත් සඳහන් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක:07-35 වගන්තිය අනුව මෙය නිවැරදිව ගිණුම්ගත කර ඇති බව දන්වා සිටිමි. | ප්‍රමිතයට අනුව නිවැරදිව ගිණුම් සැකසීමට කටයුතු කල යුතුය. |
| II. වර්ෂය තුළදි කෙරීගෙන යන වැඩ (Capital work in progress) රු.5,561,222 ක් ජංගම නොවන වත්කම් සඳහා ප්‍රාග්ධනීත කර තිබුණද, එමගින් මුදල් ගලාඒමක් හෝ මුදල් ගලායාමක් සිදු නොවන නමුත්, මුදල් ගලාඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන වැඩ ගිණුමේ ශේෂය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒමක් ලෙසත් දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමක් වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙසත් සඳහන් කර ඇති නිසා ආයෝජන ක්‍රියාකාරකම් අධි තක්සේරු වී නොමැත. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | එම |
| III. සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ රු.136,086,521 ක සේවක ණය ලබා දී තිබුණු අතර, රු.146,979,660 ක සේවක ණය අයකරගෙන තිබුණි. එම මුදල් ගලායාම සහ ගලාඒම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ සේවක ණය ලබාදීම් හා නැවත අයකර ගැනීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙනත් ණයගැතියන් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා ඇත. මෙය ඉදිරියේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | එම |
| IV. ස්ථාවර තැන්පතු දෙකකට අදාල පිළිවෙලින් රු.51,473,087 ක් හා | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීම හා ස්ථාවර | එම |

| | | | |
|---|---|---|---|
| | රු.257,248,540 ක් මුදල් කරගෙන තිබුණද එම මුදල් ගලාප්ම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි. | තැන්පතු වර්ෂය තුළදී මුදල් කරගැනීම යන දෙකෙහි ශුද්ධ අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහයට ගලපා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 – 22 වගන්තිය අනුව ශුද්ධ අගය මත මුදල් ප්‍රවාහය ගලපා ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42( b ) වගන්තිය ප්‍රකාරව, පූර්ව වර්ෂවල ප්‍රමාණාත්මක වැරදි නිවැරදි කිරීමේදී, පෙර වර්ෂයේ වත්කම්, වගකීම්, සහ හිමිකම් ගිණුම්වල ආරම්භක ශේෂයන් නැවත ස්ථාපිත කිරීම (Restating) සිදුකළ යුතු වුවත්, සංස්ථාව විසින් එම වරද නිසියාකාරව නිවැරදි නොකිරීම නිසා, පසුගිය වර්ෂ 10 කදී සංස්ථාවේ ශුද්ධ ලාභය රු.182,376,560 කින් ඌන ගණනය වී තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ පැවති වෙළඳ තොග වටිනාකම් ගිණුම්කරණ ප්‍රමිත අංක 02 කට අනුව සටහන් කර ඇති බව කාරුණිකව දන්වමි. | එම |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව අවසන් තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු අතර, අවසන් තොගය පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය අඩුවන විට, එම වෙනස වියදමක් ලෙස ලාභයෙන් කපා හල යුතුය. ප්‍රමිතියට පටහැනි වෙළඳ තොග සඳහා, තොග නශ්‍ය වීම වෙනුවෙන් සියයට 15 ක ප්‍රතිශතයක් වෙන්කිරීම් වශයෙන් වැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පසුගිය වර්ෂවලදී අනුගමනය කර තිබුණි. එම වැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2021 වර්ෂයේදී අනුගමනය නොකර, තොග නශ්‍යවීම වෙනුවෙන් රු.244,674,913 ක වෙන්කිරීමක් සිදුකර ඇති බව සටහන් අංක 1.3.1.7 මගින් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණි. | තොග නශ්‍යවීම වෙනුවෙන් වෙන්කරන සියයට 15 ක වෙන් කිරීම මෙම වර්ෂයේ වෙන් නොකර, මේ දක්වා පැවති සමුච්චිත වෙන්කිරීම තොග ගිණුමේ සටහන් කර ඇත. මෙම වෙන්කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ගණනය කිරීමේදි ඉඩදෙන වියදමක් ලෙස සලකා කටයුතු කිරීමට අවස්ථා සලසා ඇති හෙයින්, එය නැවත ස්ථාපිත කිරීමට කටයුතු කර නොමැති බව දන්වා සිටිමි. | එම |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල පිරියත උපකරණ අයිතමයන්හි ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරනු ලබන රු.796,253,922 ක්වූ වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා | අදහස් දක්වා නොමැත. | එම |

| | | |
|---|---|---|
| ගිණුම් ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදිව ධාරන අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) අම්පාර ගෘහ භාණ්ඩ සංකීර්ණයෙහි රු.114,258,780 ක් වටිනා අයිතම 5465 කට අදාල අර්ධ නිමි භාණ්ඩ තොගය, භෞතික සත්‍යාපනයකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල අවසන් තොගයට එක්කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | තොග භෞතික සත්‍යාපනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරිමට කටයුතු කල යුතුය.. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ නීත්‍යානුකූල බදු කුලී ගිවිසුමක් නොමැතිව, 2017 සිට 2021 දක්වා වර්ෂ 05 කට අදාලව බදු කුලී ආදායම ලෙස රු.14,700,000 ක් 2021 වර්ෂයේ ගිණුම්වල දක්වා තිබුණි. | සංස්ථාව පාර්ශවයෙන් බදු කුලී ගිවිසුම් සකසා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇතත්, ගිවිසුම් ගත වීමක් සිදු නොකර තවදුරටත් නියමිත රජයේ තක්සේරු බදුකුලී නොගෙවමින් සිටින බව දන්වා සිටිමි. | දෙපාර්තමෙන්තුව සමඟ සාකච්ඡා කර බදු කුලී ලබා ගැනිමට හෝ නිත්‍යානුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජනවලින් ලැබිය යුතු පොලී ආදායම රු.122,957,700 ක් වුවද, රු.124,495,091 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙහි පොලී ආදායම රු.1,537,391 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ආයෝජන පොලී ආදායම ගණනය කිරීමේදී ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු.1,537,391 ක් ප්‍රමාද දෝෂයකින් වැඩිපුර ගණනය වී ඇත. මෙය 2022 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදි පොලී ආදායම ගිණුම්වල දැක්විමට කටයුතු කළ යුතුය. |
| (ඇ) විකුණුම් අත්තිකාරම් වලින් පියවන ලද රු.103,246,849 ක් අත්පිට විකුණුම් පාලන ගිණුමට හර කිරීම නිසා, විකුණුම් ආදායම හා විකුණුම් අත්තිකාරම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මුදලට විකුණුම් පාලන ගිණුමේ පවතින රු.103,246,849 නොපියවූ ඉන්වොයිස්පත් ඇති අතර එම වටිනාකම මුදලට විකුණුම් අත්තිකාරම් ගිණුමේ පවතින ශේෂය රු.131,176,540කින් පියවා තුලනය කිරීමට සිදුකර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අම්පාර ප්‍රාදේශීය කාර්යාලය, ගෘහ භාණ්ඩ සංකීර්ණය, දැව ඉරුම්හල, දැව ගබඩාව, නේවාසිකාගාර ඇතුළු ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | i. ඉඩම් ඔප්පු<br>ii. අයිතිය තහවුරු කර ගැනීමේ ලිපි, ලේඛණ | මෙම ඉඩම් රජය සතු බවත්, තුනී ලෑලි සංයුක්ත මණ්ඩලය විසින් 1991 සංස්ථාවට පවරා දී ඇති බවත් ලිපිගොනුවල සඳහන් වුවද, ඒ සම්බන්ධව වෙනත් කිසිඳු ලියවිල්ලක් නොමැත. ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට ඔප්පු පවතී නම් එම ලේඛණ ඉදිරිපත් කරන ලෙස ද, අදාල ආයතන සමඟ සාකච්ඡා කරන ලෙස ද කළමණාකාර නීති මගින්, ප්‍රාදේශීය කළමණාකාර අම්පාර වෙත අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | ඉඩම් වල අයිතිය තහවුරු කර ගෙන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 සිට 2021 දක්වා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබියයුතු ගොඩනැගිලි කුලිය රු.89,502,660 ක් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ලැබියයුතු බදු කුලී මුදල් ලබාගැනීම සඳහා එන්තරවාසියක් ද යොමුකර ඇති අතර, අමාත්‍යංශ ලේකම්තුමා ද දැනුවත් කර, එම කුලී මුදල ගෙවන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | හිග ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට දැව සැපයුම්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් මුදල රු.21,823,345 ක් වූ අතර, ඉන් රු.9,843,560 ක් වර්ෂ 02 සිට 05 ඉක්මවූ අත්තිකාරම් විය. ඒවා පියවා ගැනීමට හෝ, ඊට අදාල කාර්යයන් ඉටු කරවා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අත්තිකාරම් පියවා ගැනීම හා ඊට අදාල කාර්යයන් ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.1,731,821 ක් වූ අතර, ඉන් රු.1,661,488 ක් වර්ෂ 03 ට අධික කාලයක් පරණ ඒවා විය. | මෙම මුදල අයකර ගැනීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාමාර්ග ගනු ලැබුවද අයකර ගැනීමට හැකියාවක් නොමැති බව තහවුරු වී ඇති බැවින් එම ණය කපාහැරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2021 අනුව විගණන හා කලමනාකරණ කමිටුවේ නිර්දේශය ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | ආයතන වලින් අයවිය යුතු මුදල් අයකර ගැනිමට යාවත්කාලිනව කටයුතු කල යුතුය. |
| (ඈ) රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ අත්තිකාරම්වලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු මුදල රු.2,588,632 ක් විය. ඉන් වර්ෂ 2 ක ඉක්මවූ ශේෂය රු.1,953,882 ක් විය. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරන ලද වැඩබිම් වල දැව සැපයීම සඳහා මාර්ග ඉදිකිරීමට දරන ලද වියදම් වන අතර කොන්ත්‍රාත්කරුවන් විසින් තැන්පත් කරන ලද ඇප මුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබයි. | එම |
| (ඉ) අම්පාර ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයේ ණයට විකුණුම් වලින් අයවිමට ඇති මුදල රු.13,091,111 ක් වූ අතර, ඉන් රු.7,767,938 ක් වර්ෂ 02 ක් ඉක්මවා තිබුණි. මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් ප්‍රකාශ කර නොමැත | ණය යාවත්කාලිනව අයකර ගැනිමට කටයුතු කළ යුතු අතර, අය නොවන ණය අයකර ගැනිමට නිතීමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) අම්පාර ප්‍රාදේශීය කාර්යාල සේවකයින් සඳහා ලබා දී තිබූ විවිධ ණය මුදල් වලින් 2021 දෙසැම්බර් 31 දිනවන විට අයකර ගත නොහැකි ණය වටිනාකම රු. 247,365 ක් විය. ඒ අතර, වර්ෂ 13 ඉක්ම වූ ණය ශේෂයයන් ද පවතින අතර, එම ණය මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | බොහෝ කාලයක සිට අයකර ගත නොහැකි මෙම ණය ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ලියාහැරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව සඳහන් කරමි | අයකර ගැනීමට නොහැකි ණය අයකර ගැනීමට නීත්‍යානුකුලව කටයුතු කලයුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,136,211,699 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.47,119,129 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු1,183,330,828 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වර්ෂයේ විකුණුම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු1,113,975,135 කින් වැඩිවීම හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 43 කින්ද , මූල්‍ය ආදායම සියයට 18.7 කින්ද වැඩි වී තිබුණු අතර, මෙහෙයුම් ආදායම සියයට 74 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් සියයට 6.2 න් අඩු වී තිබුණු අතර, පරිපාලන වියදම් සියයට 4 කින් වැඩි වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සියයට 3.9 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 26 ක අඩුවීමක් වූ අතර, ක්ෂණික අනුපාතය සියයට 3.2 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8 ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 48.3 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 10.2 ක වැඩිවීමක් වූ අතර, ශුද්ධ ලාභ අනුපාතය සියයට 26.2 ක් විය. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 83.2 ක වැඩිවීමකි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අම්පාර දැව ඉරුම්හලෙහි 2021 වර්ෂයේ දී ඉරු දැව බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතයට ගෙන තිබුණු රු.27,403,059 ක් වටිනා ඝන ඩෙසිමීටර් 1,061,904 ක් වූ දැව කඳන්වලින් ඝන ඩෙසිමීටර් 679,749 ක ඉරු දැව ප්‍රමාණයක් නිමවුම ලෙස ලබා ගෙන තිබුණි. ඒ අනුව දැව පරිවර්තනය කිරීමේ දී සිදු වී ඇති අපතය දැව ඝන ඩෙසිමීටර් 542,719.17 ක් වූ අතර, එය මුළු දැව ප්‍රමාණයෙන් සියයට 51 ක ප්‍රතිශතයක් විය. තවද දැව, ඉරු දැව බවට පරිවර්තන කිරිමේදි සිදු විය හැකි සාමාන්‍ය අපතය ගණනය කර ද නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | එසේ සිදු විය හැකි අපතය ගණනය කළයුතු අතර, එම ප්‍රමාණය ඉක්මවන්නේ නම් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) කල්දෙමුල්ල සංකීර්ණයේ CCTV කැමරා සවි කිරිමේදී නිවැරදිව සැලසුම් නොකිරිම හේතුවෙන් නියෝජ්‍ය කළමනාකාරතුමාගේ කාර්යාලය තුල සවි කරන ලද කැමරා ප්‍රධාන ආරක්ෂක මුරකුටියේ සවිකිරිමට කටයුතු කිරිම හේතුවෙන් රු.275,000 ක අමතරව පිරිවැයක් දැරිමට සිදු වි තිබුණි. | CCTV දර්ශන නැරඹීමට රූපවාහිනි යන්ත්‍ර 02 ක් ස්ථාපිත කරන ලදී. ප්‍රධාන මුරකුටිය අසලට CCTV කැමරා අත්‍යවශ්‍ය බව තහවුරු වූ අතර, ඉතා අබලන් වූ ලෑලිවලින් සකස්කර තිබූ මුරකුටිය වෙනුවට නව මුරකුටියෙහි ඉදිකිරීම් කටයුතු අවසන් වී තිබූ බැවින් ප්‍රධාන මුරකුටිය අසල CCTV කැමරාවක් කාර්යාලයේ තිබූ රූපවාහිනි දර්ශන පථය ස්ථාපිත | කාර්යය කිරිමට ප්‍රථම අදාල සැලසුම් නිවැරදිව සිදු කිරිමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කිරීමට සුදුසුයයි තීරණය කරන ලදී. CCTV කැමරා පද්ධතිය සවිකර ඇති ගෘහ භාණ්ඩ යන්ත්‍රාගාරයේ සිට ප්‍රධාන ගේට්ටුව සඳහා මීටර් 250 ක පමණ දුරක් ඇති බැවින්, මේ සඳහා Universal Cable එකක්, යකඩ කණු 4 ක් මඟින් යන්ත්‍රාගාරයේ සිට ප්‍රධාන ගේට්ටුව වෙත CCTV කැමරා හා දර්ශන පථය සවිකර ඇත. | |
| (ඇ) 2015 ඔක්තෝබර් 30 දිනැති බූස්ස සංකීර්ණයේ පවත්වන ලද වෙන්දේසිය, චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව විධිමත් වෙන්දේසි මණ්ඩලයකින් තොරව පැවැත්වීමෙන් සංස්ථාවට රු.576,310 ක අලාභයක් සිදු වී ඇති බව විමර්ශන වලදී හෙළිදරව් වී තිබුණි. විමර්ශන වාර්තාවට අනුව එම නිලධාරීන් අදාල චෝදනාවෙන් නිදහස් කර තිබුනද සංස්ථාවට ඇති වී තිබූ රු.576,310 ක අලාභය අය කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | එහිදී ලබා දි ඇති විනය නියෝගය පරිදි අවවාද කිරීමට පමණක් දන්වා ඇත. විමර්ශන වාර්තාවේ නිර්දේශ පරිදි අදාල නිලධාරින් වෙතින් නිදහසට කරුණු කැඳවීම් කර ඇති අතර එහි අලාභයන් පිළිබඳව සඳහන් වේ. එමඟින් නිදහසට කරුණු සලකා බලා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) ගේ නිර්දේශය ලබා ගන්නා ලෙස එවකට සාමාන්‍යාධිකාරි විසින් උපදෙස් ලබා දී ඇත. අදාල උපදෙස් ප්‍රකාරව කඳන් තොගවල මිල අඩු වැඩි කිරීම් වෙන්දේසි මණ්ඩලයේ තීරණයන් වන බැවින් එම තීරණය පිළිගත යුතු බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) නිර්දේශ ලබා දී ඇත. ඒ අනුව එවකට විනය බලධාරියා ලෙස සාමාන්‍යාධිකාරි විසින් විනය නියෝග ලබා දී ඇත | අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවසන් තොගයට ඇතුලත් නොකරන ලද, එහෙත් දැව ගබඩා වල රඳවාගෙන ඇති වන අපරාධ ලෙස ලැබුණු රු.114,056,534 ක් වටිනා ඉරූ දැව ඝන ඩෙසිමීටර් 1,112,166 ක් සහ රු.65,601,485 ක් වටිනා ඝන ඩෙසිමීටර් 3,586,873 ක් අඩංගු දැව කඳන් පැවතුණි. එම දැව සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛණය මඟින් අධිකරණය සඳහා නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාරව අධිකරණය දැනුවත් කර | අදහස් දක්වා නොමැත. | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අධිකරණ නියෝගයක් ලබා ගෙන එම දැව විකුණා ලබා ගන්නා මුදල් නඩු කටයුතු අවසන් වන තුරු අධිකරණයේ තැන්පත් කිරීමට හෝ එම දැවවල වටිනාකම ගණනය කර තොග පොත්වලට ගැනීමටත් සංස්ථාව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) අම්පාර දැව ගබඩාවේ රජයේ කැළෑ දැව 2015 වර්ෂයේ සිට පවතින අතර මුළු කඳන් ප්‍රමාණය 14,527 ක්ද, එහි මුළු ඝන ඩෙසිමීටර් ප්‍රමාණය 1,172,921 ක් විය. මෙම පැරණි දැව කඳන් ඉතා විශාල ලෙස විනාශ වී ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මේ වන විට අලෙවි කිරීම සඳහා වෙන්දේසි තොග සකස් කර ඇත | කඩිනමින් අලෙවි කර ගැනිමට කටයුතු කළ යුතුය |
| (ඇ) මඩකලපුව දැව ගබඩාවේ 2021 දෙසැම්බර් 31 දිනට රජයේ කැළෑවලින් ලැබෙන රු.17,636,441 ක් වටිනා තේක්ක ඝන ඩෙසිමීටර් 570,530 ක් පැවති අතර ඒවා 2018 වර්ෂයේ සිට පැවත එන බව නිරීක්ෂණය විය. | මඩකලපුව දැව ගබඩාවේ රජයේ කැලෑවලින් ලැබෙන දැව 2018 වසරේ සිට ඉතිරි වී ඇති අතර, මේවන විට එම කඳන් සියල්ල තොග ලෙස අට්ටිගසා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | කඩිනමින් අලෙවි කර ගැනිමට කටයුතු කළ යුතුය |
| (ඈ) අම්පාර දැව ගබඩාවේ පරිත්‍යාග ඝන ඩෙසිමීටර් ප්‍රමාණය 400,808 ක් වූ දැව කඳන් 3040 ක් වූ අතර 2014 වර්ෂයේ සිට පැවත එන කඳන්ද පැවතුනි. ඒවා ගබඩා භූමිය තුල තැන තැන ගොඩගසා ඇති බවත්, ඒවා දිරාපත් වෙමින් පවතින බවත් විගණනයට නිරීක්ෂණය විය. | මේ වන විට පරිත්‍යාග දැව ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් අලෙවි කර ඇත. ඉතිරි දැව අලෙවි කිරීම සඳහා වෙන්දේසියට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවති. | දැව ගබඩා පරිපාලන කටයුතු ක්‍රමානුකූලව කළ යුතුය. |
| (ඉ) අම්පාර දැව ගබඩාවේ රජයේ කැළෑවලින් ලැබෙන දැව,පරිත්‍යාග දැව සහ වන අපරාධ දැවවලට අදාල දැව කඳන් පහසුවෙන් හඳුනාගත හැකි වන ආකාරයට වෙන් වෙන් වශයෙන් ගබඩා කර නොතිබුණි. දැව ගබඩා භූමියෙහි පිළිවෙලකින් තොරව තැන තැන ගොඩ ගසා තිබුණි. ඒ අනුව මෙම එකිනෙක දැව කඳන් කලවම් වීමේ ඉඩකඩක් පවතින බවත්, ඇතැම් දැව කඳන් බොහෝ කාලයක සිට කැළෑවෙන් වැසිගොස් තිබු බව විගණනයට නිරීක්ෂණය විය. | රජයේ කැලෑවලින් ලැබෙන දැව, පරිත්‍යාග දැව හා වන අපරාධ දැව ලෙස වෙන් වෙන් වශයෙන් ගබඩා කිරීම සිදුනොවූ අතර, මේ වනවිට කඳන් නිසිලෙස සකස් කිරීමේ කටයුතු කරනු ලබයි. | දැව වර්ගීකරණය කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) අම්පාර දැව ගබඩාවේ ඉරූ දැව ගබඩා කර තිබූ ගොඩනැගිලි 2 ක් ඉතා අබලන් තත්ත්වයක පැවති අතර, වහලවල් දිරාපත්වී වැස්සට තෙමෙන තත්ත්වයක පැවතුණි. මෙම හේතුව නිසා දැව විනාශ වීමේ අවදානමක් තිබුණි. තවද නිෂ්පාදනාගාරයේ, දැව ගබඩාව අබලන් තත්වයක පැවතිම හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයක් පැවතුණි. මෙම ගොඩනැගිලි අලුත් වැඩියාකිරීමට කටයුතු කරද නොතිබුණි. | පැරණි ඉරූ දැව ගබඩා ගොඩනැගිල්ලේ තිබූ ඉරූ දැව ඉවත් කර ඇත. අට්ටිමඩු ගලවා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතියන් සඳහා ඉංජිනේරු අංශය වෙත ඉදිරිපත් කර ඇත. නව අට්ටිමඩුවක් සකස් කිරීමට ද, යෝජනා කර ඇත. | ගොඩනැගිලි අළුත්වැඩියාකර දැව ආරක්ෂිතව තැබීමට කටයුතු කළ යුතුය. |
| (උ) අම්පාර දැව ගබඩාවේ 2016 වර්ෂයේ ඝන ඩෙසිමීටර් 169 ක් ද, 2017 වර්ෂයේ ඝන ඩෙසිමීටර් 438 ක්ද, 2019 වර්ෂයේ ඝන ඩෙසිමීටර් 09 ක්ද ලෙස එකතුව ඝන ඩෙසිමීටර් 616 ක වටිනාකම රු.415,757 ක් වූ කළුවර දැව තොගය රාජ්‍ය දැව සංස්ථා නිෂ්පාදනාගාරවලට හෝ ජාතික ශිල්ප සභාවට භාරදීමට කටයුතු නොකර නිෂ්කාර්යව ගබඩාවෙහි රඳවාගෙන තිබුණි. | කළුවර ශාකයෙන් පරිවර්තනය කරන ලද එලය සහිත දැව කැබලි කිහිපයක් බූස්ස ගබඩාවට යැවීමට කටයුතු කරන ලෙසත්, ඉතිරි එලය සහිත කොටස්වලින් පරිවර්තනය කරන ලද දැව, වෙන්දේසි මගින් අලෙවි කිරීමටත් සහකාර සාමාන්‍යාධිකාරි (අලෙවි) විසින් 2022 මාර්තු 25 දින උපදෙස් ලබාදී ඇති අතර, ඒ අනුව කටයුතු සිදුවෙමින් පවති. | කඩිනමින් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළ යුතුය |
| (ඌ) ලාහුගල - මොරාන හෙක්ටයාර් 20 ක දැව හෙලා ඉවත් කිරීම සඳහා අම්පාර දිසා වන නිලධාරී හා සංස්ථා අම්පාර ප්‍රාදේශීය කළමණාකරු අතර, 2021 ජුලි 05 දින ගිවිසුම් අත්සන් කර ඇති අතර, වැඩ අවසන් කලයුතු දිනය 2021 සැප්තැම්බර් 30 දින විය. එහෙත් දැව හෙලා ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරුව පිරිනමා තිබුණේ 2021 සැප්තැම්බර් 17 දින වන අතර, වලංගු කාලසීමාව 2021 ඔක්තෝම්බර් 15 දින විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිවිසුම් ප්‍රකාරව 2021 සැප්තැම්බර් 30 දින වැඩබිම භාරදිය යුතු වුවත්, 2022 ජනවාරි 20 දින වන විටත් වැඩබිම භාර දී නොතිබුණි. | මොරාන බක්මිටියාව වැඩබිමේ දැව හෙලා ඉවත් කිරීම සඳහා තෝරාගත් ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු එකඟනොවීම හේතුවෙන් දෙවනවර මිලගණන් කැඳවීමෙන් තෝරාගත් ජයග්‍රාහී කොන්ත්‍රාත්කරු සමඟ 2021 සැප්තැම්බර් 17 දින ගිවිසුම් අත්සන් ලදී. පැල සිටුවීම සඳහා සුදුසු අයුරින් වැඩබිම සකස්කොට 2021නොවැම්බර් 24 දින, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදී ඇත. ගිවිසුම් කාලය දීර්ඝ කර ඇති අතර, කඳන් ගබඩාවට සැපයීම 2022 ජනවාරි 25 දින අවසන් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට වැඩබිම් බාරදීමට කටයුතු කළ යුතුය. |
| (එ) අම්පාර නිෂ්පාදනාගාරයෙහි සමාලෝචිත වර්ෂය තුල නිෂ්පාදන වැඩ සඳහා ඇස්තමේන්තු 86 ක් ලැබී තිබුණු අතර ඉන් වැඩ 25 ක් සඳහා අවශ්‍ය දැව පෙර වැඩ සඳහා නිකුත් | අදහස් දක්වා නොමැත. | වියිමත් ක්‍රමවේදයකට අනුව දැව නිකුත් කල යුතුය |

| | | |
|---|---|---|
| කර ඉතිරි දැව උපයෝගී කර ගෙන නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව දැව ගබඩාවෙන් නිෂ්පාදනාගාරයට දැව නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්, එවැනි තත්ත්වයක් යටතේ නිෂ්පාදනාගාරයේ දී සිදුවන දැව අපතය වලක්වා ගත නොහැකි බවත් විගණනයට නිරීක්ෂණය විය. | | |
| (ඒ) අම්පාර නිෂ්පාදනාගාරයෙහි නිම කළ වැඩ (Job) සඳහා ඉරූ දැව (Sawn Timber) ඝන ඩෙසිමීටර් 265,862 ක් ගබඩාවෙන් ඉල්ලා තිබුණ ද, ඝන ඩෙසිමීටර් 319,233 ක දැව ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. මෙහි දී නිෂ්පාදන වැඩ 35 ක් සඳහා ඇස්තමේන්තු දැව අවශ්‍යතාවය ඉක්මවා සියයට 02 සිට සියයට 157 දක්වා පරාසයක් තුළ වැඩියෙන් දැව නිකුත් කර තිබුණු අතර එය සමස්ථයක් ලෙස සියයට 42 ක් ඉක්මවා තිබුණි . | අදහස් දක්වා නොමැත. | ප්‍රමිතයකට අනුව දැව නිකුත් කල යුතුය |
| (ඔ) අම්පාර නිෂ්පාදනාගාරයෙහි 2019 වර්ෂයේ සිට 2022 ජනවාරි දක්වා වැද්දුම් වැඩ නිම නොකල ඇනවුම් 35 ක් වූ අතර 2018 වර්ෂයට පෙර සිට වැද්දුම් වැඩ නිම කරන ලද එහෙත් ඔප දමා නොමැති රු.109,587,380ක්වූ ගෘහ භාණ්ඩ අයිතම 90 ක් විය.තවද බේරුවල ප්‍රාදේශිය සභාවෙන් ලැබි තිබුණු රු. රු.4,254,200ක් වූ ඇණවුම ලගම වූ යන්ත්‍රාගාර වලට භාර නොදී අම්පාර යන්ත්‍රාගාරයට භාර දීමෙන් ප්‍රවාහනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වි තිබුණි. | අදහස් දක්වා නොමැත. | කඩිනමින් වැඩ නිම කලයුතු අතර පිරිවැය අවම වන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ඕ) අම්පාර නිෂ්පාදනාගාරයේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට ලබා ගත් ලී වලින් සියයට 50 ක් පමණ ඉතිරි වන අතර ඒවා යොදාගෙන අතුරු නිෂ්පාදන සැකසිමට යොමුවි නොතිබුණි. මෙම ඉතිරි වන ලී අනාරක්ෂිතව ගොඩගසා තිබුණු අතර ඒවා ප්‍රයෝජනයට ගැනිමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අපතය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ක) නිෂ්පාදන ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍යවූ රු.මිලියන 49.6 ක් පමණ වටිනාකමින් යුත් යන්ත්‍රෝපකරණ ලබා ගැනීමට 2021 වර්ෂයේ සිට ඉල්ලීම් කර තිබුණ ද 2022 ජනවාරි මස වන විටත් එම යන්ත්‍රෝපකරණ ලබා දිමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ග) සමාලෝචිත වර්ෂයේ අම්පාර නිෂ්පාදනාගාරයට ලැබී තිබුණු වැඩ පැවරුම් 86 න් වැඩ 05 කට අදාල වැද්දුම් වැඩ සුළු ප්‍රමාණයක් ද වැඩ 06 කට අදාල ඔප දැම්මේ සුළු වැඩ ප්‍රමාණයක් ද සංස්ථා ස්ථිර සේවකයන් යොදා ගනිමින් ඉටු කර තිබුණු අතර ඉතිරි වැඩ සියල්ලක්ම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් ඉටු කරවා ගෙන තිබුණි. 2021 වර්ෂයේ දී මෙම සේවකයන්ට එකතුව රු.8,984,905 ක වැටුප් ගෙවා තිබුණු අතර කෙටි වැඩ යටතේ වැද්දුම් වැඩ සඳහා පමණක් කොන්ත්‍රාත්කරුවන්ට රු.6,087,245 ක වැඩ කුලී ගෙවා තිබුණි. ඒ අනුව ස්ථිර කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඉතා පහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | එම | අපතය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ච) අම්පාර දැව ගබඩාවේ තොග ලේඛනවලට අනුව 2012 වර්ෂයේ සිට තොග පැවතිය ද එම තොග භෞතිකව පවතිනවා ද, එසේ නොමැතිව ඒවා දිරාපත් වී ගොස් ද යන්න හඳුනාගත නොහැකි විය. | අදහස් දක්වා නොමැත | සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය |
| (ට) නිසි කලට භාවිතයට නොගැනීම හේතුවෙන් හානි වීම හා වෙනත් විවිධ හේතූන් මත 2017 සහ 2019 වර්ෂවලට අයත් විවිධ වර්ග වල ඉරූ දැව, වෙන්දේසි දැව ලෙස කොටස් කර විකිණීම සඳහා වෙන් කර තිබූ රු.33,251,030 ක් වටිනා ඝන ඩෙසිමීටර් 124,928.75 ක් 2022 ජනවාරි වන විටත් අම්පාර දැව ගබඩා සංකීර්ණය තුල අනාරක්ෂිතව ගොඩගසා තිබුණි. | එම තොග භෞතිකව පවතින බව සඳහන් කර ඇති අතර, සුළු වශයෙන් දිරාපත්වීමට ද ලක්ව ඇත. මෙවන විට එම තොග සියල්ල අලෙවි කිරීම සඳහා සකස් කරමින් පවතී. | කඩිනමින් වෙන්දෙසි කිරිමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඩ) අම්පාර දැව ඉරුම්හලෙහි පැවති රු.7,136,534 ක් වූ දැව ඝන ඩෙසිමීටර් 366,112 ක ප්‍රමාණයක් ඉරු දැව බවට පරිවර්තනය නොකර දිරාපත් වෙමින් පැවතුණි. | අදහස් දක්වා නොමැත | දිරාපත් වීමට නොදී ඉරු දැව බවට පත් කර අලෙවි කිරිමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ සංකිර්ණයේ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව රු.736,400 ක ගෘහ භාණ්ඩ අයිතම 03 ක ඌනතාවයක් ද, දැව කඳන් 48 ට අදාලව රු.429,125 ක් වූ ඝන ඩෙසිමීටර් 13,520 ක ඌනතාවයක් සහ දැව කඳන් 31 ට අදාලව රු.401,789 ක් වටිනා ඝන ඩෙසිමීටර් 12,526 ක් ද, රු.92,352 ක් වටිනා ඝන ඩෙසිමීටර් 1,528 ක් වශයෙන් ඉරු කුඹුක් දැව තොගය ද සමීක්ෂණ වාර්තාවට ඇතුලත්ව නොතිබුණි. | ඌණතා ලෙස සඳහන් කඳන් 48න් කඳන් තුනක් මාරු නිකුත් කිරීම් යටතේ 2022.01.22 දින නව ගබඩාව විසින්, කල්දෙමුල්ල වෙත මාරුකර යවා ඇත. ඉන් කඳන් දෙකක් පරිවර්තනය කර ඇත. ඉතිරි කඳන් 43 මේ වනවිටත් ගබඩා අංගනයේ සුරක්ෂිතව ඇති බව තහවුරු කරගන්නා ලදී.<br>කුඹුක් කඳක් මේවන විටත් තොග පොතෙහි හා තොග සමීක්ෂණ ලේඛණයෙහි ද කඳන් ලෙස පෙන්නුම් කරන අතර, ගබඩා භූමියේ ද එම කඳ ඇත. තවද, ඉතිරි කඳන් 29 පරිවර්තන හා මාරු නිකුත් කිරීම් මගින් වෙනත් ගබඩාවකට යවා ඇත. | සමීක්ෂණ මණ්ඩල කාර්යයන් නිවැරදිව කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර 3 වෙත 2021 වර්ෂයේ ලද ඇණවුම් සංඛ්‍යාව 395 ක් වූ අතර, ඉන් ඇණවුම් 99 ක් හෙවත් සියයට 25 කට සමාන ප්‍රමාණයන් වර්ෂය තුළදී නිම කර නොමැති බව විගණනයේදි නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | නියමිත දිනට නිමකර භාරදීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2006 සිට ක්‍රියාත්මක වූ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට පටහැනිව නියෝජ්‍ය ප්‍රාදේශීය කළමණාකරුවකු, ප්‍රාදේශීය කළමණාකාර තනතුරකට 2016 අගෝස්තු සිට පත්කර තිබුණි. මේ | මෙය සංස්ථාවේ 2011 වර්ෂයේ සිට සිදුවී ඇති ක්‍රියාදාමයකි. 2006 ජනවාරි 01 දින සිට සේවකයින් බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට පරිබාහිරව සිදුකර ඇති අතර මෙවැනි වැරදි ශ්‍රේණිගත උසස්වීම් හා බඳවා ගැනීම් | අනුමත නීතිරීති වලට අනුව විධිමත් පරිපාලන ක්‍රමවේදයන් අනුගමනය කරමින් උසස්වීම් ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| හේතුව නිසා එම නිලධාරියාට රු. 677,597 ක් වැටුප් ලෙස වැඩියෙන් ගෙවා තිබුණි. | දළ වශයෙන් 439 ක් හඳුනා ගන්නා ලදි. ඒවා නිවැරදි කිරීමට යාමේදී ඇතිවන ආයතනික බලපෑම් පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් මත අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත තීරණයක් ගැනීමට යොමුකර ඇති අතර දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ක්‍රියාකාරී සැළසුමක් සකස්කර ඇත. එමගින් ලද උපදෙස් මත බාහිර පාර්ශවයන් මඟින් සේවක අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය සිදු කිරීමට කටයුතු කරමින් පවතී.එහි තිරණය ලද පසුව මේ පිළිබඳ කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) 2018 වර්ෂයේ රොබ්ගිල් වැඩබිමේ යුකලිප්ටස් වර්ගයේ ගස් 2172 ක් පූර්ණ හෙලිමේදී සිදුව තිබූ අක්‍රමිකතාව සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකොට තිබුණ ද, එයට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරික්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ හේතුන් මත විමර්ශනය සිදු කිරීම කල්ගත වීම සහ කමිටු කොන්දේසි සඳහා පොදු එකඟතා නොලැබීම මත විමර්ශන වාර්තාව ලැබීම ප්‍රමාද වී ඇත. මෙතෙක් එම වාර්තාව ලැබී නොමැති බව වාර්තා කරමි. මේ සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස අමාත්‍යාංශ විගණන කළමනාකරණ කමිටුව මඟින් උපදෙස් ලැබී ඇති අතර , විනය නියෝගය ලබාදීම හා විනය පරීක්ෂණය පිළිබඳ පැහැදිලි තීරණයක් ලබා ගැනීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස සභාපති විසින් දන්වා ඇත . | සංස්ථා විනය සංග්‍රහයේ "4 වන පරිච්ඡේදයේ" සඳහන් විනයානුකූල ක්‍රියා පරිපාටිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) සංස්ථාව් නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට කටයුතු නොකොට සහ පනත මගින් නෛතිකව පවරා ඇති ප්‍රධාන කාර්යයන් සඳහා අවධානය යොමු නොකොට බාහිර පාර්ශවයන් විසින් නිෂ්පාදිත රු.511,875 ක වටිනාකමකින් යුත් විසිතුරු භාණ්ඩ තොගයක් මිලදී ගෙන විකිණීමට සංස්ථාවේ නිලධාරීන් කටයුතු කර ඇති බැවින් එය විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය. | මේ සඳහා ලබාදී ඇති අනුමැතීන් සහ රාජකාරී පැවරීම් හා උපදෙස් අදාල ලිපි සහ වාර්තා පමණක් රජයේ විගණන අංශය වෙත යොමුකර ඇත. සංස්ථාවේ අලෙවි ආදායම ඉහළ නැංවීමේ අරමුණින් දැවමය ගෘහ භාණ්ඩ බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සකස් කරන ලද කමිටු වාර්තාවට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | පනත මගින් අනුමත ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීමට සංස්ථාව කටයුතු කල යුතුය |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බුස්ස ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයේ පවතින වායු සමීකරණ යන්ත්‍ර 08 න්, වටිනාකම රු.1,154,944 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 07 ක් 2018 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතියද ඒවා අපහරණය කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සම්බන්ධව නියෝජිත ආයතන සමඟ සාකච්ඡා කර තවදුරටත් එම යන්ත්‍ර පාවිච්චියට සුදුසු තත්වයට පත්කරගැනීමට හැකියාව පිළිබඳව සොයාබැලීමට කටයුතු යොදන අතර, එසේ නොවුවහොත් අපහරණය කිරීමට ඉදිරියේදී කටයුතු යොදන බව දන්වා සිටිමි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2019 වර්ෂයට පෙර සිට පැවත එන රු.3,951,682 ක් වටිනා ඝන ඩෙසිමීටර් 71,989 ක දැව තොගයක් භාවිතයට නොගෙන අම්පාර දැව ගබඩාවේ නිෂ්ක්‍රීයව තිබුණි. | 2019 වර්ෂයට පෙර සිට පැවත එන ඝ.ඩෙ.මී. 71,989 මිල්ල, **SPU,** මෛක්‍රෝ, ගිණිසපු, ලුණුමිදෙල්ල, 1 පන්තිය, වෙනත්, 3 පන්තිය, සපු වැනි දැව වලින් සමන්විත වේ. මේවා ගෘහභාණ්ඩ නිෂ්පාදනයට යොදා නොගන්නා අතර, වර්ෂ 10කට වැඩි කාලයක්පැරණි තොග වේ. එබැවින් අදාල ඉරුදැව වෙන්දේසි මගින් අලෙවිය සඳහා තොග සකස් කරමින් පවති. | කාලිනව අලෙවි කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) අම්පාර ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයෙහි රු.1,198,758 ක් වටිනා භාණ්ඩ අයිතම් 33 ක් දෝෂ සහිත භාණ්ඩ ලෙස හදුනා ගෙන තිබුණු අතර ඇතැම් භාණ්ඩ නිෂ්පාදනය කර වර්ෂ 10 ඉක්මවා තිබුණි. | වෙන්දේසි සඳහා ඉදිරිපත් කර ඉතිරිව ඇති ගෘහභාණ්ඩ හා දෝෂ සහිත ගෘහභාණ්ඩ ලෙස ප්‍රාදේශීය කමිටුව විසින් නිර්දේශ කරන ලද මිල කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතියෙන් පසු අලෙවි සඳහා තබා ඇති ගෘහභාණ්ඩ වේ. | අලුත්වැඩියා කටයුතු සිදු කර අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත 2010 හා 2016 වර්ෂයන්හි ලැබී තිබූ රු.300,300 ක් වටිනා ඇණ තහඩු තොගය ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ගබඩාවෙහි රදවා ගෙන තිබූ අතර ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පුද්ගලික ඉඩම්වලින් විදුලි කණු හා අලිවැට කණු ලබාගැනීමට කටයුතු සූදානම් කර තිබූ බැවින්, එම තහඩු ඇණ තොග ගබඩාවේ රඳවාගෙන තිබුණි | කඩිනමින් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළ යුතුය |
| (ඉ) අම්පාර නිෂ්පාදනාගාරයේ නිශ්ක්‍රීය වූ යන්ත්‍ර 07 ක් පවතින අතර එවා අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ අපහරනය කිරිමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| (ඊ) අම්පාර නිෂ්පාදනාගාරයේ 2018 වර්ෂයටත් පෙර සිට පැවත එන ගෘහ භාණ්ඩ තොග වූ අතර රු.36,374,180 ක් වටිනා ගෘහ භාණ්ඩ වැද්දුම් අංශයේ පැවතුණි. | එම | එම |
| (එ) වාර්ෂික සාමාන්‍ය අලෙවිය සැලකිල්ලට ගෙන නිෂ්පාදන සැලසුම් සකස් කිරීම කල යුතු වුවත්, එසේ නොකොට වර්ෂය තුල තවදුරටත් නිෂ්පාදනය වැඩි කිරීම තුලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.22,880,300 ක් වටිනා ගෘහභාණ්ඩ තොගයක් ගබඩාව තුල පැවතුණි. | එම | මනා සැලසුමක් සහිතව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කළ යුතුය |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිර්ඝ කාලයක් තිස්සේ කලමණාකරන මට්ටමේ තනතුරු 91 ක පුරප්පාඩු පැවතුණි.එම තනතුරු සඳහා බඳවා ගැනිමේ කටයුතු නොකර වැඩ ආවරණයට නිලධාරින් පත්කර තිබුණි. | පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට 2019 වර්ෂයේ සිට අනුමැතිය ඉල්ලා තිබුණද, රජය විසින් විටින් විට බඳවා ගැනීම් තහනම් කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ප්‍රතිපත්ති ප්‍රකාරව මේ වනතෙක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී නැත. මෙහෙයුම් ක්‍රියාවලිය අඛන්ඩව පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වැඩ බලන/වැඩ ආවරණ පත්වීම් ලබා දී රාජකාරි ඉටුකර ගන්නා බවත් බඳවා ගැනීම් සඳහා අනුමැතීන් ලද පසු මෙම තත්ත්වය නිවැරදි කරන බවත් දන්වමි. | අනුමැතීන් ලබාගෙන බඳවා ගැනීම් කටයුතු සිදුකළ යුතුය. |